# අපනයනයට ඉහළම ඉල්ලුමක් ඇති අන්නාසි සහ වැල්දෙඩම් වෙළඳපොළ

රංජනී අතුකෝරාළ
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිනී

ලංකාවේ පලතුරු නිෂ්පාදනය දෙස සංසන්දනාත්මක ව බලන විට එය එතරම් දියුණු අංශයක් ලෙස සැලකිය නො හැක.. සැපයුම් සහ වගා කර ඇති බිම් ප්‍රමාණයත්, ජනගහනය වැඩි වීමත් සමග ස්ථාවරව පැවතිමෙන් මෙය පැහැදිලි වේ. නමුත් පොදුවේ බලන කල පලතුරු වර්ග විශාල සංඛ්‍යාවක් දැකිය හැකි අපේ රට පලතුරු වත්තක් ලෙය හැඳින්විය හැකියි. රට යටත් විජිතයක්ව සිටි සමයේ විදේශකයින් මෙහි වැවීමට උනන්දු වී ඇත්තේ තේ, රබර්, පොල් වැනි ආර්ථික බෝගය. රට ස්වාධීන තත්ත්වයට පත්වීමෙන් පසුවත් අප වැඩි වශයෙන් පෙළඹුනේ සහල් සහ අනෙකුත් ප්‍රධාන ආහාර බෝග සම්බන්ධ කෘෂිකාර්මික පර්යේෂණවලටයි. දැන් දැන් ක්‍රමයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පුද්ගලික අංශයත් පලතුරු වගාව සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කොට තිබේ. මන්ද, අපේ පලතුරු වලට විදේශ වෙළඳපොලක් තිබීමත්, අපේ පලතුරු නිෂ්පාදනවලට වෙළඳපොලේ හොඳ අනාගතයක් තිබිය හැකි බවත් නිසාය. අපේ රටේ පලතුරු වගාව ප්‍රධාන ආකාර දෙකකට සිදු වේ. එකක් ගෙවතුවල ඉබේම වාගේ වැවෙන පලතුරු ගස්, අනික් එක වෙළඳපොල ඉලක්ක කර ගෙනම වවන පලතුරු ගස් ලෙසයි. පලතුරු නිෂ්පාදනය වැඩි දියුණු කිරිමෙන් විදේශ වෙළඳපොලට පලතුරු සැපයීම සහ ග්‍රාමීය පෙදෙස්වල ගොවීන්ගේ ආර්ථික තත්ත්වය වැඩි දියුණු වීම පමණක් නොව රටේ ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීමට ද එය උපකාරී වේ.

1980/81 සමාජ ආර්ථික සමීක්ෂණයකට අනුව ලංකාවේ එක් පුද්ගලයෙකු පරිභෝජනය කරන පලතුරු ප්‍රමාණය මසකට ග්‍රෑම් 800 ත් 900 ත් අතර ප්‍රමාණයකි. වැඩිපුරම පරිභෝජනයට ගන්නා පලතුරු වර්ග කෙසෙල්, පැපොල් සහ අඹ වේ. ලංකාවේ වැඩි වශයෙන් වැවෙන පලතුරු වර්ග ලෙස කෙසෙල් පැපොල්, වැල්දෙඩම්, අඹ සහ අන්නාසි හැඳින්විය හැකි අතර, අලිගැටපේර, මිදි, මැංගුස්, රඹුටන් සාමාන්‍ය ප්‍රමාණයෙන් වැවේ. මෑත කාලයේ දී වාණිජමය අයුරින් අන්නාසි සහ වැල්දෙඩම් වගාව කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කවල වැඩිදියුණු තත්ත්වයට පත් වී ඇත. මේවායින් පිළියෙල කරන ලද ජෑම්, ජෙලි යුෂ සහ ටින් කරන ලද පලතුරු අපනයනය කෙරේ. මේවායින් වැඩි කොටසක් අපනයනය කරනු ලබන්නේ මැදපෙරදිග රටවලටයි. ගම්පහ, කළුතර, කෑගල්ල සහ බදුල්ල දිස්ත්‍රික්කයන් හි වැල්දෙඩම් වැඩි වශයෙන් වැවෙන අතර අන්නාසි වගාව සඳහා ගම්පහ, කුරුණෑගල සහ කොළඹ යන දිස්ත්‍රික්ක ප්‍රසිද්ධ වේ. රජය මගින් මෙම වගාවන් දියුණු කිරීම සඳහා දෙනු ලබන සහනාධාර වැඩි කිරීමෙන් පසු මෑත වර්ෂවලදී මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක වලද මෙම වගාවන් ප්‍රචලිත වී ඇති බව පෙනේ. මෙ රටේ වැවෙන අන්නාසි කිව් සහ මුරුසි වශයෙන් ප්‍රධාන වර්ග දෙකකින් යුක්තය. මුරුසි අන්නාසි වැඩි වශයෙන් කෙලින්ම පරිභෝජනය සඳහා ගනු ලබන අතර නොයෙකුත් නිෂ්පාදන සකස් කිරීම සඳහා කිව් වර්ගය වැඩි වශයෙන් භාවිතා වේ.

වැල් දෙඩම් කහපාට වර්ගය සහ දම්පාට වර්ගය යන ලෙසින් වර්ග දෙකකින් යුක්ත වන අතර තෙත් කලාපයට වඩා සුදුසු වන්නේ කහපාට වර්ගයයි. මෑතදී හඳුන්වා දී ඇති දම්පාට වර්ගය වියලි කලාපයට නිර්දේශ කොට ඇත. මෙමු පලතුරු කාලීන බෝග මෙන්ම බොහෝ විට වගා කෙරෙන්නේ මිශ්‍ර බෝග ලෙස බැවින් වගා කෙරෙන අස්වැන්න ප්‍රමාණය හරියටම කිව නොහැකිය. ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල හෙක්ටයාර් 1,250 ක් සහ හෙක්ටයාර් 800 ක අන්නාසි වගා කර ඇති අතර ඒවායින් පිළිවෙළින් මෙට්‍රික් ටොන් 14,010 සහ 700 ක වාර්ෂික නිෂ්පාදනයක් බලාපොරොත්තු වේ. තවද වැල්

දෙඩම් හෙක්ටයාර් 250 ක් සහ 820 ක් කළුතර සහ, බදුල්ල දිස්ත්‍රික්ක වල වගා කර ඇත. මෙම දිස්ත්‍රික්ක වලින් පිළිවෙලින් මෙට්‍රික් ටොන් 220 ක් සහ 1,710 අස්වැන්නක් බලාපොරොත්තු විය. මුල් අවුරුද්ද තුලම මේවායේ පලදාව ලබාගත හැකිවාක් මෙන්ම දෙවන අවුරුද්ද තුලදී ඉහලම අස්වැන්න ප්‍රමාණය ලැබේ. කෙසේ වෙතත්, දළ වශයෙන් හෙක්ටයාර් එකකින් වැඩිපුර වැවෙන වැල්දෙඩම් කහපාට වර්ග යෙන් මෙට්‍රික් ටොන් 30ක පමණ අස්වැන්නක් අපේක්ෂා කරන අතර අන්නාසි හෙක්ටයාර් එකකින් මෙට්‍රික් ටොන් 70 ක පමණ අස්වැන්නක් ලබා ගත හැකි. ගොවීන්ගේ පලතුරු පැල අවශ්‍යතාවයන් සපයා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන විද්‍යා අංශය අවශ්‍ය කටයුතු කරයි. එමගින් කලට වේලාවට, නිරෝගී, ශක්තිමත් සුදුසු ප්‍රභේද මිල පැල සපයා වගාව නංවාලීම ඔවුන්ගේ අරමුණයි. ඒ සඳහා දැන් ක්‍රියාත්මක වන පලතුරු සහනාධාර වැඩපිළිවෙල තවත් වසර පහකට දීර්ඝ කොට ඇත.

පලතුරු වෙළඳපොල සමීක්ෂණ වලදී පෙනී යන කරුණක් ලෙස අස්වැන්න ගොඩ ගැසෙන කාලයේදී සැපයුම ඉල්ලුම ඉක්මවා යන තත්ත්වය හැඳින්විය හැකිය. අන්නාසි සහ වැල්දෙඩම් වලට ද මේ තත්ත්වය පොදුය. එමෙන්ම ඈත පළාත්වලින් බේද ගැරීමේ දී අපහසුකම් නිසා පලතුරු අපතේ යන අවස්ථා බොහෝ ය. මෙම හේතු නිසා එම කාලයේ නිෂ්පාදනයකයාම ලැබෙන්නේ ඉතා අඩු මිලකි. එමෙන්ම අනෙක් තත්ත්වය නම් අවාරයේදී පාරිභෝගිකයාට ඉතා ඉහළ මිල ගණන් වලට පලතුරු මිලයට ගැනීමට සිදු වීමයි. විශේෂයෙන්ම මෙය නාගරික පාරිභෝගිකයාට බලපාන ප්‍රශ්නයක්. ඔවුන්ට වැඩි මිලක් ගෙවීමට සිදු වෙනවාක් මෙන්ම හොඳ තත්ත්වයේ පළතුරු ලබා ගැනීමත් අසීරු වේ.

එබැවින් ටින් කළ යුෂ, පානයට සූදනම් කල බීම, කෝඩියල්, ජෑම් ජෙලි සහ ටින් කල පලතුරු වැනි සකස්කල නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීමට නිෂ්පාදකයෝ උනන්දු වෙති. මෙම කර්මාන්ත වලදී වැල්දෙඩම්වලට වැඩි ම ඉල්ලුමක් ඇත. ඊළඟට වැඩිම ඉල්ලුමක් හිමි වන්නේ අන්නාසිවලටය. වැල්දෙඩම් සහ අන්නාසි වල අලෙවිකරණ රටාවේදී එයට වැඩි වශයෙන් හවුල් වන්නේ පෞද්ගලික අංශය බව කිව හැක. ගොවීන් තම නිෂ්පාදන ග්‍රාමීය පොලට ගෙන ඒම සහ ග්‍රාමීය මට්ටමේ එකතු කරන්නන් ගොවීන් වෙතට ගොස් තොග ලබා ගෙන පොලට රැගෙන එම ග්‍රාමීය මට්ටමේ දී දැකිය හැකි අලෙවිකරනයේ මුල්ම අවස්ථාවයි. ඊළඟට ප්‍රවාහන නියෝජිතයන් මගින් නගරයේ තොග වෙළෙන්ද (කොමිස් නියෝජිතයා) ලබා ගන්නා තොග සිල්ලර වෙළෙන්ද ලබා ගන්නා අතර ඔහු මගින් අවසානයේ දී පාරිභෝගිකයා අතට පත්වීම අලෙවි රටාවේ සරල ආකාරයයි. සමහර අවස්ථා වලදී කොළඹ තොග වෙළඳුන් අතට පත් නොවීම, කෙලින්ම සිල්ලර වෙළෙන්දන්ට පලතුරු අලෙවි කිරීම සිදු වේ. අන්නාසි සහ වැල්දෙඩම් වලින් සකස් කරන අනෙකුත් නිෂ්පාදන සඳහා නිෂ්පාදකයින් විසින් තොග වෙළෙන්දගෙන් හෝ නගර මට්ටමේ එකතු කරන්නන්ගෙන් තොග මිලට ගනී. ජෑම්, කෝඩියල්, ටින් කල පලතුරු වැනි නිෂ්පාදන කර්මාන්ත ශාලාමගින් සිල්ලර වෙළෙන්දන්ට සහ අපනයනකරුවාට සපයනු ලබයි. තොග වෙළඳ පොලට ගෙනෙන අන්නාසි ගෙඩි වල ප්‍රමාණයේ හැටියට වර්ග කොට මිල නියම කරනු ලැබේ. කොළඹ තොග වෙළඳපොලේ අන්නාසිවල ප්‍රමාණයේ හැටියට විශාල ප්‍රමාණය, මධ්‍යම ප්‍රමාණය සහ කුඩා ප්‍රමාණය ලෙස වර්ග තුනකට වෙන් කර ඇත. අන්නාසි වාරයේ දී ප්‍රමාණ තුනකට වර්ග කර ඇති අවස්ථා වල් වෙළඳපොලේ දැකිය හැකිය. තොග වෙළඳුන් බර අනුව වැල් දෙඩම් අලෙවි කරන අතර මේවා යෝනිවලට අනුරා වෙළඳපොලට ගෙන යනු ලැබේ. නමුත් අන්නාසි වලට විශේෂ ඇසුරුම් ක්‍රමයක් නැත. වෙළඳ පොලේ පවතින ඉල්ලුම සහ සැපයුම අනුව මෙම පලතුරු වල වෙළඳපොලේ මිල තීරණය වේ. මුළු නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අපනයන වෙළඳපොලට යැවෙන බැවින් මෙම පලතුරු වර්ග වල ඉල්ලුම, දේශීය ඉල්ලුම සහ අපනයන ඉල්ලුම ලෙස් කොටස දෙකකින්: දැක්විය හැක. මෙය වැල්දෙඩම් සහ අන්නාසිවලට මෙමෙන් අඹවලටත් පොදුය. දේශීය ඉල්ලුම විශාල වශයෙන් වෙනස් නොවන නිසා, සැපයුම් ප්‍රමාණ මත මිල උච්චාවචනය වන අතර තොග මට්ටමේ දී මිල තීරණය වේ.

අනෙක් අතට අපනයන ඉල්ලුම සලකා බැලීමේදී, අනෙකුත් නිෂ්පාදන සකස් කරන්නන් බොහෝ විට පලදාවෙන් වැඩි කොටසක් ගොවීන්ගෙන් හෝ එකතු කරන්නන්ගෙන් කෙළින් ම ලබා ගන්නා බැවින් ඔවුන් විසින් මිල තීරණය කිරීමේ දී යම් බලපෑමක් කරනු ලැබේ. එබැවින් ගොවිපල මට්ටමේ දී මෙම දෙදෙනා (තොග වෙළෙන්දා සහ කර්මාන්තකරුවා) මිල සඳහා මූලික පදනමක් ගොඩ නගන අයවේ.

වැඩි වශයෙන් අන්නාසි අස්වැන්න ලැබෙනුයේ දෙසැම්බර්,–පෙබරවාරි සහ මැයි–ජූලි කාලයන්හිදී බැවින් එම කාලයේදී වෙළඳපොලේ මිල පහල බසී. එමෙන්ම වැල්දෙඩම් වෙළඳපොලට වැඩි වශයෙන් සැපයෙනුයේ අවුරුද්දේ ජූනි – අගෝස්තු මාසවලදී ය.

1981, 1982 වර්ෂවලදී වැල්දෙඩම් මෙට්‍රික් ටොන් 1951 ක් සහ 2871 ක් ජර්මනිය, නෙදර්ලන්තය සහ ස්විට්සර්ලන්තය වැනි රටවලට අපනයනය කොට ඇත. එමෙන්ම අන්නාසි (පිළියෙල නොකල) මෙට්‍රික් ටොන් 84 ක් සහ 288 ක් පිළිවෙලින් එම වර්ෂවලදී බෙල්ජියම, ජර්මනිය, මාලදිවයින, පෘතුගාලය වැනි රටවලට අපනයනය කර ඇත.

ජෑම්, ජෙලි, පලතුරු යුෂ සහ ටින් කරන ලද පලතුරු වැනි නිෂ්පාදන කිහිපයකටම ඩුබායි, සිංගප්පූරුව සහ මැලේසියාව යන රටවල් වලින් හොඳ ඉල්ලුමක් ඇත. මෙහි දී අපට තරඟකාරී රට වන්නේ ඉන්දියාවයි. නමුත් අප ඔවුන් සමග තරඟ කොට විදේශ වෙළඳපොල ජය ගැනීමට අපේ නිෂ්පාදන ඉහලම මට්ටමෙන් වෙළඳපොලට ඉදිරිපත් කළ යුතුයි.

අලෙවි ගැටළු, රෝග සහ කෘමි උවදුරු සහ රෝපන ද්‍රව්‍ය හිඟකම පලතුරු නිෂ්පාදනයේ දී අප ගොවියාට මුහුණ පෑමට සිදු වන ප්‍රධාන ගැටළු වේ. දුෂ්කර ප්‍රදේශවල සිටින ගොවියාගේ ප්‍රධාන ප්‍රශ්නය ප්‍රවාහන අපහසුතාවයයි. එබැවින් හොඳින් සංවිධානය වූ එකතු කරන මධ්‍යස්ථාන ඒ ඒ පලතුරු සඳහා ආවේණික ප්‍රදේශවල පිහිටුවිය යුතුයි. වැල්දෙඩම් සහ අන්නාසි මෙන්ම අනෙකුත් පලතුරු ද වගාව වැඩිදියුණු කිරීමෙන් අපේ දේශීය ඉල්ලුම සපුරාලීම යන මූලික අරමුණු ඉටු වෙනවා පමණක් නොව අපට විදේශ වෙළඳපොල ද ජය ගත හැක. එමෙන්ම පලතුරු වැඩිවශයෙන් වැවෙන ප්‍රදේශවල පලතුරු ඇසිරීමේ, සකස් කිරීමේ කම්හල් බිහි කිරීමෙන් පලතුරු අපතේ යෑම වැලැක්විය හැකි අතර, රැකියා නියුක්තිය වැඩිවීම, විදේශ විනිමය ඉපයීම සහ ජනතාවගේ පෝෂණ තත්ත්වය දියුණු කිරීමට ද ඉවහල් වේ.